# ආර්ථික විද්‍යාව

## ආර්ථිකයක් හැඳින්වීම

T - 1

1) 1) ආර්ථික විද්‍යාව යනු කුමක්ද?
   2) "ආර්ථික විද්‍යාත්මකව සිතීම" යනු කුමක්ද?
   3) "ආර්ථික විද්‍යාව විද්‍යාවක් වන අතර එය සමජ විද්‍යාවකි". මෙම ප්‍රකාශය විමසන්න.
   4) ආර්ථික විද්‍යාව ඉගෙනීමේ වැදගත්කම පහදන්න.

2) 1) "ආර්ථික විද්‍යාවේ ක්‍රමවේදය" හඳුන්වන්න
   2) යථානුරූපී හා අභිමතානුරූපී ආර්ථික විද්‍යාව අතර වෙනස කුමක්ද?
   3) "සූක්ෂම ආර්ථික විද්‍යාව" හා "සාර්ව ආර්ථික විද්‍යාව" හඳුන්වන්න.

3) 1) මිනිස් අවශ්‍යතා සහ උවමනා යනු මොනවාද ?
   2) අවශ්‍යතා සහ උවමනා අතර වෙනස පහදන්න.
   3) භාණ්ඩ හා සේවා යනු මොනවාද?
   4) භාණ්ඩ, "ආර්ථික භාණ්ඩ" හා "ආර්ථික නොවන භාණ්ඩ" ලෙස කොටස් දෙකකට වෙන් කෙරේ. මෙම කොටස් දෙක අතර වෙනස පහදන්න.

4) 1) "නිෂ්පාදන සම්පත්" යන්න හඳුන්වන්න.
   2) නිෂ්පාදන සම්පත් වර්ග කෙරෙන ප්‍රධාන කොටස් දෙක නම් කර කෙටියෙන් පහදන්න.
   3) නිෂ්පාදන සාධකයක් වශයෙන් "භූමිය" යනු කුමක්ද?
   4) ස්වභාවික සම්පත් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ. එම කොටස් දෙක නම්කර කෙටියෙන් පහදන්න.

5) 1) නිෂ්පාදන සාධකයක් වශයෙන් "ශ්‍රමය" යනු කුමක්ද?
   2) "ශ්‍රම බලකාය" හඳුන්වන්න.
   3) ශ්‍රම විභජනය සහ විශේෂීකරණය යන්න හඳුන්වා පහදන්න.

6) 1) නිෂ්පාදන සාධකයක් වශයෙන් "ප්‍රාග්ධනය" යනු කුමක්ද?
   2) ස්ථාවර හා කාරක ප්‍රාග්ධනය හඳුන්වන්න.
   3) මූල්‍ය හා මූර්ත ප්‍රාග්ධනය හඳුන්වන්න.
   4) භෞතික හා මානව ප්‍රාග්ධනය හඳුන්වන්න.
   5) "ප්‍රාග්ධන සම්පාදනය" නැතහොත් "දළ ආයෝජනය" යන්න හඳුන්වන්න.
   6) "ප්‍රාග්ධන සම්පාදන මූලාශ්‍ර" යන්න නම්කොට උදාහරණ දක්වන්න.

7) 1) නිෂ්පාදන සාධකයක් වශයෙන් "ව්‍යවසායකත්වය" යනු කුමක්ද?
   2) ව්‍යවසායකයකුගේ කාර්යභාරය කෙටියෙන් හඳුන්වන්න.
   3) ව්‍යවසායකත්වය අනෙකුත් නිෂ්පාදන සාධක අතරින් විශේෂ වන්නේ ඇයි?

8) 1) "හිඟකම" යනු කුමක්ද?
   2) "හිඟකමක් පැවතීම නිසා තේරීමක් කළ යුතුවේ". මෙම ප්‍රකාශය විමසන්න.
   3) ආර්ථික පද්ධතීන් මුහුණ දෙන "මූලික ආර්ථික ප්‍රශ්න" මොනවාද?
   4) සම්පත් බෙදා වෙන්කිරීමේ ප්‍රශ්නය යන්නෙන් කුමක් අදහස් වේද?
   5) නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය යන්නෙන් කුමක් අදහස් වේද?
   6) ආදායම් බෙදීයාමේ ප්‍රශ්නය යන්නෙන් කුමක් අදහස් වේද?

9) 1) "නිෂ්පාදන හැකියා ආදර්ශය" යනු කුමක්ද?
   2) "නිෂ්පාදන හැකියා ආදර්ශය" ගොඩනැඟීමේදී යොදාගනු ලබන උපකල්පන මොනවාද?
   3) නිෂ්පාදන හැකියා වක්‍රය යනු කුමක්ද?
   4) X හා Y යන භාණ්ඩ වර්ග දෙක නිපදවෙන සරල ආර්ථිකයක විවිධ විකල්ප නිෂ්පාදන හැකියාවන් දැක්වෙන ආකාරයට නිෂ්පාදන හැකියා වක්‍රය ගොඩනඟන්න.

PULASTHI PATHIRANA

10) 1) ආවස්ථික පිරිවැය යනු කුමක්ද?
2) වැඩිවන ආවස්ථික පිරිවැය යනු කුමක්ද?
3) වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය යනු කුමක්ද?
4) ස්ථාවර ආවස්ථික පිරිවැය හඳුන්වන්න.
5) අඩුවන ආවස්ථික පිරිවැය යනු කුමක්ද?
6) "ආවස්ථික පිරිවැය මූර්ත සංකල්පයකි". මෙම ප්‍රකාශය විමසන්න.
7) ආවස්ථික පිරිවැය ශුන්‍ය වන අවස්ථා මොනවාද?

11) 1) "නිෂ්පාදන හැකියා වක්‍රයේ වෙනස්වීම" සහ "නිෂ්පාදන හැකියා ලක්ෂයක් විතැන්වීම" පහදන්න.
2) පහත සංකල්ප, නිෂ්පාදන හැකියා වක්‍රයක් උපයෝගී කරගනිමින් පැහැදිලි කරන්න.
- හිඟකම.
- තේරීම හා ආවස්ථික පිරිවැය.
- ආර්ථික වර්ධනය.
- ආර්ථිකය බිඳවැටීම.
- ආර්ථික සම්බාධක පැනවීම.
- ආර්ථික අවපාත තත්ත්වය.

12) 1) "ආර්ථික කාර්යක්ෂමතාවය" යනු කුමක්ද?
2) "නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය" යනු කුමක්ද?
3) "සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාවය" යනු කුමක්ද?
4) "ඌන සේවා නියුක්තිය" යනු කුමක්ද?

13) 1) ආන්තික ආවස්ථික පිරිවැය යනු කුමක්ද?
2) ආන්තික ප්‍රතිලාභ සංකල්පය පහදන්න.
3) "ආන්තික පිරිවැය" සහ "ආන්තික ප්‍රතිලාභ" යන සංකල්ප භාවිතා කරමින් ආර්ථිකයක් තම සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාවය ඉටුකරගන්නා ආකාරය පහදන්න.
4) ආර්ථිකයක්, සාපේක්ෂ වාසි න්‍යාය මත පදනම්ව ජාත්‍යන්තර වෙළඳාමට පිවිසෙන ආකාරය පැහැදිලි කරන්න.

PULASTHI PATHIRANA

****************************************

*මතක පොතට...*

*උණුසුම නළලතේ අත්ලෙන් මැන්නා ය*
*වෙදගෙට ගියේ පොරවා කර පින්නා ය*
*මළපොත අකුර මට පෙන්නා දුන්නා ය*
*දෙවියන් බුදුන් මෙන් මා ළඟ උන්නා ය*

*ප්‍රේමකීර්ති ද අල්විස් නම් වූ සොඳුරු කලාකරුවාණන් විසින් සිය මෑණියන්ගේ වියෝවෙන් පසු ඇ වෙනුවෙන් ලියූ කවියකි. මෙම සොඳුරු කලාකරුවා 1989 වසරේ ජූලි මස 31 වැනිදා රාත්‍රියේ දී නාඳුනන තුවක්කුකරුවකු විසින් කුරිරු ලෙස ඝාතනය කරන ලදී..*

